# හේනේබැද්ද ආදිවාසී ජනතාවගේ උප සංස්කෘතිය සහ එහි වෙනස්වීම පිළිබඳ සිදුකළ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්.

**කෝණාර මුදියන්සේලාගේ. අයි.එස්.කේ[1], හේරත් මුදියන්සේලාගේ. එන්.එස්[2]**

දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව සුවිශේෂී සමාජ කොට්ඨාසයකි. ඔවුනට ආවේණික වූ එක්තරා උප සංස්කෘතික රටාවක් පවතින අතර එය වර්තමානය වන විට ක්‍රමික වෙනස්වීම්වලට බඳුන් වී තිබේ. මෙහි දී ශ්‍රී ලංකාවේ ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ හේනේබැද්ද ආදිවාසි ගම්මානයේ ආදිවාසී ජනතාවට ආවේණික වූ උප සංස්කෘතිය සහ එහි කාලීන වෙනස්වීම් පිළිබඳව මානව විද්‍යාත්මක විග්‍රහයක් සිදුකර ඇත. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වුයේ ද මෙය යි. අරමුණ ක්‍රියාවට නැංවීමේ දී අධ්‍යයන ප්‍රදේශයෙන් අරමුණු සහගත ලෙස තෝරාගත් ආදිවාසී පවුල් පහළොවක් දත්ත ලබා ගැනීම සඳහා භාවිත කොට ඇත. නියැදි ප්‍රමාණය (N=15) දත්ත සන්තෘප්ත අවස්ථාව සලකා තීරණය කෙරිණි. අරමුණු සහගත නියැදියක් යටතේ තෝරාගත් පවුල්වල එක් පුද්ගලයා බැගින් යොදාගෙන සිදු කළ සම්මුඛ සාකච්ඡා, ගැඹුරු සම්මුඛ සාකච්ඡා, ප්‍රත්‍යයෙක අධ්‍යයන ආදියෙන් දත්ත ලබා ගැනිණි. අනතුරුව එක්රැස් කරගත් දත්ත කේතකරණයට ලක්කොට තේමාත්මක විශ්ලේෂණ ක්‍රමවේදයක් ඔස්සේ ක්‍රමානුකූලව විශ්ලේෂණය කිරීම සිදුවිය. තේමාත්මකව සිදු කළ දත්ත විශ්ලේෂණයෙන් පසු හෙළිකරගත් පර්යේෂණ සොයාගැනීම් පහත පරිදි ය. ආදිවාසී විවාහ ක්‍රම ආදිවාසී සාම්ප්‍රදායිකත්වයෙන් මිදී සාමාන්‍ය නෛතික රාමුවක් යටතට විතැන් වීම සහ සිංහල ප්‍රජාව සමග විවාහ වීම, මල්වර චාරිත්‍ර, කුළුඳුල් ගැබ් ගැනීම් අවස්ථා ආදිය ආදිවාසි ප්‍රජාවගේ සාම්ප්‍රදායික චාරිත්‍රවලින් ඈත් වීම, අතීත වැදි ජනයා භාවිත කළ ආයුධ (දුන්න, ඊ තල, කෙටේරිය) වර්තමානය තුළ භාවිතය සීමා කිරීම හා භාවිත නොකිරීම, තමන්ගේ වාසස්ථාන සකස් කර ගැනීමේ දී අතීතයේ තිබූ මැටි නිවෙස්වල සිට නූතන සිමෙන්ති නිවාස දක්වා විකාශනය වීම, වත්මන් ආදිවාසී දරුවන් නූතන සමාජ රටාවට අනුවර්තනය වීමට උත්සාහ දැරීම හේතුවෙන් ආදිවාසි උප සංස්කෘතිය වියැකී යාම වැනි සාධක ආදිවාසී ජනතාවගේ උප සංස්කෘතිය වෙනස්වීම නිසා ඇති වූ තත්ත්වයන් ලෙස හඳුනාගත හැකි ය. මෙහිදී හේනේබැද්ද ආදිවාසී ප්‍රජාව පදනම් කොටගනිමින් ඔවුන්ගේ උප සංස්කෘතිය සහ එහි වෙනස්වීම් පිළිබඳව මානව විද්‍යාත්මක විග්‍රහයක් සිදු කර තිබේ.

**මුඛ්‍ය පද :** හේනේබැද්ද ආදිවාසී ජනතාව, උප සංස්කෘතිය, නවීකරණය, සාම්ප්‍රදායිකත්වය, අනුවර්තනය

[1]ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය. ishan4113@gfmail.com